*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

**8 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. රූප වන්දනාව කිනම් පනතට විරුද්ධව සිදු කරන පාපයක්ද?

(1) තුන්වන පනත (2) දෙවන පනත (3) පළමු පනත (4) හත්වන පනත

02. ඉශ්‍රායෙල් ජනතාව බබිලෝනියාවේ වහලුන් ලෙස විප්‍රවාස ගතවූයේ කුමන හේතුව නිසාද?

(1) මිත්‍යා ඇදහිලි අනුගමනය කළ නිසාය. (2) කැරලිකාර ජනතාවක් වූ නිසාය.

(3) අධිරාජ්‍යයාට බදු නොගෙවූ නිසාය. (4) කතෝලික ආගම ඇදහූ නිසාය.

03. විජාතික වත් පිළිවෙත් ඉටු කිරීමට මවට හා දරු හත්දෙනාට බල කරන ලද්දේ කිනම් පාලන සමයේද?

(1) හෙරෝද් පාලන සමයේ ය. (2) පිලාත් පාලන සමයේ ය.

(3) IV වන ඔගස්ටින් සමයේ ය. (4) IV වන ඇන්ටිඕකස් එපිපානෙස් පාලන සමයේ ය.

04. පැරණි ගිවිසුමට අනුව ගිවිසුම් කරඬුව අලංකාර කරන පිණිස සාදන ලද රූපය වන්නේ,

(1) ලෝකඩ සර්පයා (2) කෙරුබ්වරු

(3) ආලෝක පහන් (4) ගොක්කොළ කුරුසය

05. ජුදා සම්ප්‍රදායට අනුව සබත් දිනයේදී දේව වචනය ගැනීමට ජුදෙව්වරු ඒකරාශි වූයේ,

(1) ධර්මශාලාවට ය. (2) ජේරුසලම් දේව මාලිගාවට ය.

(3) සීනායි කන්ද පාමුලටය. (4) ජෝර්දාන් ගඟ අසලට ය.

06. "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව ලේඛනය ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) 23 වන ජුවාම් පාවුළු පාප්තුමාය. (2) VIII වන ක්ලෙමන්ට් පාප්තුමාය.

(3) XII වන පියුස් පාප්තුමාය. (4) 16 වන බෙනඩික් පාප්තුමාය.

07. ලූක් සුවිශේෂය හැර ශු. ලූක් තුමා විසින් ලියන ලද අනෙක් කෘතිය වන්නේ,

(1) එළිදරව් පොතය. (2) ගීතාවලියය.

(3) II මකබි ග්‍රන්ථයය. (4) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතය.

08. ගැලවීමේ ඉතිහාසය සූදානම් කිරීමට දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ පළමු පුද්ගලයා වන්නේ,

(1) ස්නාවක ජුවාම්තුමාය. (2) ආබ්‍රහම් තුමාය.

(3) ආදම් ය. (4) නෝවා ය.

09. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ ස්වභාවධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යක් වන්නේ,

(1) අංශභාග රෝගියා සුව කිරීමය. (2) ජායිරස්ගේ දියණිය උත්ථාන කිරීමය.

(3) මාරුත දමනය ය. (4) කුදු ස්ත්‍රීය සුවපත් කිරීමය.

10. "ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්න." මෙය කිනම් සක්‍රමේන්තුව හා සම්බන්ධ ප්‍රකාශයක්ද?

(1) අභිවෘද්ධි ආලේපය. (2) දිව්‍ය සත්ප්‍රසාදය

(3) පූජකවරය (4) ආශිර්වාදකාර බන්ධනය

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. කිතුනු ජීවිතයේ කේන්ද්‍රය .................................................................................................................. වේ.

12. කිතුනු ජීවිතය හා බැඳී පවතින විශ්වාසයේ ක්‍රියාවලියක් ලෙස ...................................................................... පෙන්වා දෙයි.

13. ශුද්ධවූ සභාව ............................................................................................................................ ලෙස හඳුන්වයි.

14. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී.............................................................................................. ස්ථාපිත කළ සේක.

15. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළේ ................................................................................ නගරයෙන් ය.

( අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය, ගලීලය, දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, පදක්කම් පැළඳීම )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. මරණීය පාපයක් කර ඇත්නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර පාපොච්චාරණය කරගත යුතුය. ( )

17. ඉරුදිනයේ දී යාළුමිත්‍රයන් සමග විනෝදයෙන් කාලය ගත කිරීම ඉතා වැදගත් ය. ( )

18. ස්නාවක ජොහාන් තුමා පූජක පෙළපතට අයත් දිවැසිවරයෙකි. ( )

19. දිව්‍ය පූජාවේ දී ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස පූර්ණ ලෙස සමරනු ලබයි. ( )

20. 'විශ්වාස ලක්ෂණය' දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙතට අයත් කොටසකි. ( )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) ජනවන්දනාව සඳහා භාවිත වන 'ලාඕස්' හා 'එර්ගොන්' යන වචනවල අර්ථ මොනවාද?

(ii) දිව්‍ය පූජාවේ පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් කොටස් දෙක ලියන්න.

(iii) ඉරුදිනය ස්වාමීන් වහන්සේගේ දිනය ලෙස නම් කිරීමට හේතුවන කරුණු දෙකක් ලියන්න.

(iv) ක්‍රිස්තියානි ජීවිතය පෝෂණය කරමින් තම දේශයට, සංස්කෘතියට ගැළපෙන ආකාරයට පවත්වාගෙන යනු ලබන වත්පිළිවෙත් දෙකක් ලියන්න.

(v) දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය ගෞරවයෙන් භාවිතා කළ හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(vi) ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ සඳහන් කරන සුවිශේෂක කතුවරුන් දෙදෙනා කවුරුන්ද?

(vii) ස්නාවක ජොහාන් පිළිබඳව කරුණු දෙකක් ලියන්න.

(viii) දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ උපමා දෙකක් ලියන්න.

(ix) ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න.

(x) දිව්‍ය පූජාවෙන් පරිබාහිරව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අවසර ඇති සාධාරණ හේතු දෙකක් ලියන්න. (ල. 2x10=20)

02. (i) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක මොනවාද? (ල. 02)

(ii) දේව වන්දනාවේ ප්‍රධාන අංග තුන කුමක් ද? (ල. 03)

(iii) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබට කළ හැකි අර්ථාන්විත කාර්යයන් 05 ක් ලියා දක්වන්න. (ල. 05)

03. (i) කතෝලික විශ්වාසයට අනුව කිතුනුවන් විසින් නොකළ යුතු මිත්‍යා ඇදහිලි දෙකක් ලියන්න. (ල. 02)

(ii) දසපනත තුළ දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සඳහා වෙන් කර ඇති පනත් තුන නම් කරන්න. (ල. 03)

(iii) දස පනතේ පළමු පනත ආරක්ෂා කරමින් දෙවියන් වහන්සේට සමීප වීමට ඔබට කළහැකි කාර්යයන් පහක් ලියා දක්වන්න. (ල. 05)

04. (i) යාම යැදුම උච්චාරණය කළ හැකි දවසේ නිශ්චිත යාම දෙකක් ලියන්න. (ල. 02)

(ii) දේව වාක්‍ය පිළිවෙතේ කොටස් තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) දිව්‍ය පූජාවට අර්ථාන්විතව සහභාගී වීමට ඔබට කළහැකි දේවල් මොනවාද? (ල. 05)

05. (i) ශු. ලූක් සුබාරංචිය දිළින්දන්ගේ ශුභාරංචිය ලෙස හැඳින්වීමට බලපෑ කරුණු දෙක ලියන්න. (ල. 02)

(ii) ජේසුස් වහන්සේ පාළුකරයේ දී මුහුණ දුන් පරීක්ෂා ත්‍රිත්වය ලියා දක්වන්න. (ල. 03)

(iii) ඔබ ජීවිතයට පැමිණෙන පරීක්ෂාවන් ජය ගැනීමට අවශ්‍ය ශුද්ධාත්ම වරම්පතා යැදුමක් ලියා දක්වන්න. (ල. 05)

06. (i) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුළුවරුන් තුළ ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) අභිවෘද්ධි ආලේපය දානය කිරීමට බලය ඇති තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(iii) අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහක් ලියන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 2 ) 05. ( 1 ) 06. ( 3 ) 07. ( 4 ) 08. ( 2 ) 09. ( 3 ) 10. ( 1 )

11. දිව්‍ය පූජාව 12. පදක්කම් පැළඳීම 13. අතින්ද්‍රීය ක්‍රිස්තු දේහය 14. දිව්‍ය සත්ප්‍රසාදය 15. ගලීලය

16. (✓) 17. (X) 18. (✓) 19. (✓) 20. (X)

## II කොටස

01. (i) ලාඕස් = ජනතාව එර්ගොන් = සේවයකි, වැඩකි
(ii) ♦ පඬුරු පෙරහැර හා පුදසුන සූදානම් කිරීම. ♦ පඬුරු මත යැදුම.
(iii) ♦ ජේසුස් වහන්සේගේ උත්ථානය වූ දිනයයි. ♦ උත්ථාන වූ ජේසුස් වහන්සේ වැඩිපුරම දර්ශනය වූ දිනයයි. ♦ ශුද්ධාත්මාගමනය සිදු වූ පෙන්තකොස්ත දිනයයි.
(iv) ♦ ආශිර්වාද කිරීම ♦ ශුද්ධ වූ ධාතුවලට ගරු කිරීම ♦ පදක්කම් පැලඳවීම
(v) ♦ ආශිර්වාද කිරීමට ♦ ප්‍රශංසා කිරීමට ♦ යාච්ඤා කිරීමට ♦ මහිමයට පත් කිරීමට.
(vi) ශු. මතෙව් තුමා හා ශු. ලූක් තුමා
(vii) ♦ මව එළිසබෙත් තුමිය වන අතර පියා සෙකරියස් තුමාය. ♦ පළගැටියන් හා වන මී ඔහුගේ ආහාර විය. ♦ ඔටු ලොම් වස්ත්‍රයක් ඇඳ ඉණ වට හම් පටියක් බැඳ සිටී. ♦ පාළුකරයේ මොරගාන හඬ ලෙස හඳුන්වයි. ආදී කරුණුවලට ලකුණු දෙන්න.
(viii) ♦ වපුරන්නා පිළිබඳ උපමාව ♦ නිධානය, මුතු ඇටය, දැල පිළිබඳ උපමා
(ix) ප්‍රඥාව, තේරුම්ගැනීම, දැනුමැතිකම, ධෛර්යය, දැනගැන්ම, දේවභය, දේව භක්තිය.
(x) ♦ රෝගී වීම. ♦ වයස්ගත වීම. ♦ දිව්‍ය පූජාව පැවැත්වීමට පියතුමෙකු නොමැති වීම. (ල. 2x10=20)

02. (i) ♦ දේව වාක්‍ය පිළිවෙත ♦ ස්තෝත්‍ර යාගික පිළිවෙත (ල. 02)
(ii) ♦ දිව්‍ය පූජාව ♦ දේව ප්‍රසාද නිධාන ♦ යාම යැදුම (ල. 03)
(iii) ♦ ඉරුදින ශුද්ධවත් ලෙස මුළු දිව්‍ය පූජා යාගයට සහභාගී වීම. ♦ එදිනට නියමිත දේව වාක්‍ය කොටස් කියවා මෙනෙහි කිරීම. ♦ දහම් පාසලට සහභාගී වීම. ♦ හැකිතාක් දයාවේ ක්‍රියාවල නිරතවීම. ♦ රෝගීන් බැහැ දැකීම. ආදියට (පිටු අංක 83) ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. (i) බලි තොවිල්, පේන බැලීම, දෙහි කැපීම, ගුරුකම් ආදිය. (ල. 02)
(ii) ♦ සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම. ♦ දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවටවත්, නිරන්තරයටවත් නොදිවුරන්න. ♦ ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව.(ල. 03)
(iii) ♦ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම. ♦ මිත්‍යා ඇදහිලි වැලකී අන් අය මුදවා ගැනීම. ♦ දෙවියන් වන්සේ තුළ පමණක් යැපෙමින් අභියෝග වලට මුහුණ දීම. ♦ යක්ෂ, භූත, මායම් ඇති බව විශ්වාස නොකිරීම, ♦ මෙලොව ඇති සියලු දේ දෙවියන් වහන්සේ ඉදිරියේ දූවිල්ලකට සමාන බව සිතීම. (පිටු අංක 74) (ල. 05)

04. (i) ♦ උදේ යාමය ♦ සවස් යාමය ♦ දිවා යාමය ♦ රාත්‍රී යාමය (ල. 02)
(ii) ♦ පළමු දේව ප්‍රකාශය ♦ සුබාරංචිය ♦ පිළිතුරු ගීය ♦ ධර්මානුශාසනය ♦ දෙවන දේව ප්‍රකාශය ♦ විශ්වාස ලක්ෂණය ♦ සුපුවත් ජය නද ♦ විශ්වාසකයින්ගේ යැදුම. (ල. 03)
(iii) ♦ දිව්‍ය පූජාව ආරම්භයට පෙර දේවස්ථානටය ගොස් යැච්ඤා කිරීම. ♦ ගීතිකාවලට සම්බන්ධ වීම. ♦ යාච්ඤා ශබ්දනගා උච්චාරණය කිරීම. ♦ දේව වචනටය සවන් දීම හා මෙනෙහි කිරීම. ♦ භක්තියෙන් යුතුව දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම. ♦ දෙවියන් වහන්සේට ස්තුති කිරීම. ආදී කරුණුවලට ලකුණු ලබා දෙන්න. (ල. 05)

05. (i) ♦ ක්‍රිස්තුන් වහන්සේගේ උපත දුප්පත් එඬේරුන්ට පළමුව ප්‍රකාශ කිරීම. ♦ දේව රාජ්‍ය දුප්පතුන්ට උරුම බව ප්‍රකාශ කිරීම. (ල. 02)
(ii) ♦ ගල් ගෙඩියක් පාන් බවට පත් කරන්නැයි කීම. ♦ යක්ෂයාට වැඳ නමස්කාර කිරීමට අණ කිරීම. ♦ දේව මාලිගාවේ කොත මුදුනින් පහළට පැනීමට අණ කිරීම. (ල. 03)
(iii) සිසුවා ලියා ඇති ආකාරයට ලකුණු ලබා දීම. (ල. 05)

06. (i) ♦ අන්‍ය භාෂාවලින් කතා කිරීම. ♦ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම. (ල. 02)
(ii) ♦ රාජගුරු ප්‍රසදීන් වහන්සේ ♦ මීසම් සේවක පියතුමා ♦ රාජගුරුප්‍රසාදීන් වහන්සේගේ විශේෂ අවසරලත් පියතුමෙක් ♦ මරණාසන්න වූවෙකුට ඕනෑම පියතුමෙකු. (ල. 03)
(iii) ♦ ප්‍රසාද ස්නාපනය ලබා තිබීම. ♦ වයස අවුරුදු 14 සම්පූර්ණ කර සිටීම. ♦ ඉෂ්ඨ වරප්‍රසාද ඇතිව සිටීම. ♦ ප්‍රසාද නිධාන ලබා ගැනීමට ඇති ආශාව ♦ නිසි ධර්මෝපදේශක් ලබා සිටීම. (ල. 05)